අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2022

# ව්‍යාපාර අධ්‍යයනය සම්මන්ත්‍රණය

01. (i) **ව්‍යවසායකත්වය**, **ව්‍යවසායකයා** හා **ව්‍යාපාර** යන්න පැහැදිලි කරන්න.

**ව්‍යවසායකත්වය**

පරිසර අවස්ථා නිර්මාණශීලී ව උකහා ගනිමින්, අවදානමක් දරා නවෝත්පාදන බිහි කිරීමේ ක්‍රියාවලිය යි.

හෝ

මිනිස් අවශ්‍යතා හා වුවමනා හඳුනා ගෙන ඒවා තෘප්තිමත් කිරීම සඳහා ව්‍යාපාර අවස්ථා මතු කරමින්, අවදානම් කළමනාකරණය කරමින් කෙරෙන නව්‍යතා සම්පාදන ක්‍රියාවලිය යි.

**ව්‍යවසායකයා**

පරිසර අවස්ථා නිර්මාණශීලීව උකහා ගෙන අවදානමක් දරමින් නවෝත්පාදන බිහි කිරීමේ නිරත වන්නා වේ.

හෝ

වෙළෙඳපොළෙහි ඇති වන වෙනස්කම් ව්‍යාපාර සඳහා ඇති අවස්ථාවක් ලෙස සලකන පුද්ගලයා ව්‍යවසායකයාය. ඔහුගේ ආයුධය වන්නේ නව්‍යතා සම්පාදනය යි.

**ව්‍යාපාර**

මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකරලීම සඳහා ඇති ඕනෑම ආර්ථික කටයුත්තකි. නැතහොත් ලාභ ලැබීමේ අරමුණින් හෝ ලාභ අරමුණින් තොරව පවත්වාගෙන යන මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදාහැරීම, අලෙවිය හා අනුබද්ධ සියලු කටයුතු ව්‍යාපාර වේ.

(ii) **නිර්මාණශීලීත්වය** (creativity) හා **නව්‍යතා සම්පාදනය** (innovation) යන සංකල්ප අතර වෙනස දක්වන්න.

**නිර්මාණශීලිත්වය යනු,** පවතින දේට වඩා අලුත් දෙයක් නිපදවීමේ හැකියාව යි. එනම් පවත්නා තත්වයට වඩා උසස් ආකාරයෙන් භාණ්ඩ නිෂ්පාදනය කිරීමට ඇති හැකියාව යි.

**නව්‍යතා සම්පාදනය යනු,** අලුත්ම දෙයක් නිපදවීමයි. නැතහොත් බුද්ධිමය ස්වරූපයේ නව වත්කම් නිර්මාණය කිරීම යි.

02. වර්තමාන ගෝලීය ව්‍යාපාර පරිසරය තුළ සිටින ඔබ දන්නා ව්‍යවසායකයින් **හතර** දෙනෙකු නම් කරන්න.

1. ජෙෆ් බෙසොස් - ඇමසන්
2. බිල්ගේට්ස් - මයික්‍රොසොෆ්ට්
3. ඊලෝන් මස්ක් - ස්පේස් එක්ස්
4. ලැරී පේජ් - ගූගල්
5. මාර්ක් සකර්බර්ග් - ෆේස්බුක්

03. රටක් දියුණු වීමේ ප්‍රබල යාන්ත්‍රණයක් ලෙස ව්‍යවසායකත්වය පෙර කවදාටත් වඩා වර්තමානයේ ඉස්මතු වී ඇත. ව්‍යවසායකත්වය වැදගත් වීමට බලපාන හේතු දක්වන්න.

1. ආර්ථිකයේ පවත්නා ගැටලුවලට නව විසඳුම් සෙවිය හැකි වීම
2. නව ව්‍යාපාර බිහිවීම නිසා නව රැකියා අවස්ථා ජනිත වීම
3. තරුණ පරම්පරාව ඔවුන්ගේ ම ව්‍යාපාර ආරම්භ කිරීමට යොමු වීම
4. නව ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන නව වෙළෙඳපොළවල් බිහි කිරීම නිසා ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය කර ගත හැකි වීම
5. නව භාණ්ඩ හා සේවා පරිභෝජනය නිසා ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වීම
6. ප්‍රයෝජනයට නොගත් සම්පත් ප්‍රයෝජනයට ගැනීම තුළින් ප්‍රාදේශීය සංවර්ධනය
7. පවත්නා ව්‍යාපාර නවීකරණය තුළින් ව්‍යාපාරවල පැවැත්ම තහවුරු වීම
8. රැකියා ලබා ගැනීම යන සංකල්පයෙන් බැහැර වී තමන්ගේ ම ව්‍යාපාර ඇරඹීමට පෙළඹීම
9. නව භාණ්ඩ හා සේවා නිෂ්පාදනය තුළින් ආදායම් විෂමතාවය අවම වීම

04. පහත සඳහන් පුද්ගලයින් ව්‍යවසායකත්වයේ දී හැඳින්වීමට උචිත පදය සඳහන් කර පැහැදිලි කරන්න.

- දසුන් වර්තමාන ලෝකයේ පවතින වසංගත තත්වයට ගැලපෙන, පුද්ගලයින්ගේ ප්‍රතිශක්තීකරණය ඉහළ නැංවිය හැකි නව එන්නතක් නිපදවා ඉන්දියාවට අපනයනය කරයි.

  ගෝලීය ව්‍යවසායකත්වය

  ගෝලීය වශයෙන් වෙළෙඳාමේ යෙදෙන (නවෝත්පාදන) ව්‍යවසායකත්වයයි. එනම් ලෝකයේ කුමන ස්ථානයක සිටිය ද, තාක්ෂණය භාවිතයෙන් ලෝකයේ වෙනත් ඕනෑ ම රටක් හෝ ස්ථානයක් සමග සන්නිවේදනයේ යෙදී, දේශ සීමා මායිම්වලින් බැහැර ව කටයුතු කිරීමේ හැකියාවයි.

- නඳුන්, ඉන්ධන භාවිතය අවම කිරීම තුළින් පරිසර දූෂණය පිටුදැකීම සඳහා සුළං බලයෙන් ධාවනය වන මෝටර් බයිසිකලයක් වෙළෙඳ පොළට හඳුන්වා දීම

  හරිත ව්‍යවසායකත්වය

  පාරිසරික හා සමාජයීය ගැටලු හෝ අවශ්‍යතා ඉතා ඉහළ අවදානමකින් යුතුව පිළිගැනීමෙන්, ස්වභාවික පරිසරයට ධනාත්මක බලපෑම් ඇති කිරීමට ව්‍යවසායකත්ව අදහස් මගින් දැනුවත්භාවයකින් යුතුව කරනු ලබන ක්‍රියාකාරකම් හරිත ව්‍යවසායකත්වය යි.

05. ව්‍යවසායකයෙකු ව්‍යාපාර අදහස් ජනනය කරන මූලාශ්‍ර නම් කරන්න.

1. පාරිභෝගික ප්‍රතිචාරය තුළින්
2. නිර්මාණශීලී චින්තන හැකියාව තුළින්
3. පුද්ගල දක්ෂතා හා පළපුරුද්ද තුළින්
4. වෙළෙඳපොළ සමීක්ෂණ තුළින්
5. ජනමාධ්‍ය මගින්
6. සැපයුම්කරුවන් ඇසුරින්
7. තරගකාරීත්වය අධ්‍යයනය කිරීම තුළින්
8. අධ්‍යාපනික පාඨමාලා තුළින්
9. ප්‍රදර්ශන හා ඉසව් මගින්
10. වෙනත්

06. මෙරට ජනගහනය තුළ ව්‍යවසායකයින් දක්නට ලැබෙන්නේ ඉතා සුළු වශයෙනි. එවැනි වාතාවරණයක් පැවතීමට හේතු මොනවා ද?

1. ප්‍රමාණවත් ව්‍යවසායකත්ව කුසලතාවයක් නොමැති වීම
2. ව්‍යවසායකත්වයට සුදුසු ගති ලක්ෂණයන් වර්ධනය කර නොගැනීම
3. රැකියා මානසිකත්වයක් සහිතව අධ්‍යාපන කටයුතු නිමාවට පත් කිරීම
4. ජාතික මට්ටමේ අධ්‍යාපන හා පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක නොවීම
5. විවෘත වෙළෙඳපොළක් නොපැවතීම / නිදහස් වෙළෙඳපොළ ක්‍රමයක් නොපැවතීම
6. දිරි ගැන්වීමේ ක්‍රම ඇති නොකිරීම
7. පර්යේෂණ හා සංවර්ධනයට දිරිගැන්වීම් නොමැති වීම
8. ආයෝජනවලට සුදුසු මූල්‍ය වතාවරණයක් නොපැවතීම
9. ව්‍යවසායකත්ව සංවර්ධනය කෙරෙහි ධනාත්මක සමාජ හා සංස්කෘතික ආකල්ප බිහි නොවීම

07. සමාජයේ ඉටු නොවූ මිනිස් වුවමනා සඳහා නවෝත්පාදන බිහි කරනුයේ ව්‍යවසායකයෝ ය. එම නවෝත්පාදන ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ ප්‍රතිඵලයන් ලෙස බිහි වීම සිදු වේ.

(i) ඔබ ව්‍යාවසායකයෙකු යැයි සිතා නව ව්‍යාපාර අදහසක් යෝජනා කරන්න.

- බ්ලූටූත් මයික්‍රෆෝනයක් සහිත මුව ආවරණයක්
- ආරක්ෂිත බැලූනයක් සහිත හෙල්මටයක්

(ii) එම අදහසට අදාළ ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර අනුපිළිවෙලින් දක්වන්න.

1. නව්‍යතා සොයා ගැනීම / නව්‍යතා සම්පාදනය
   ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ ප්‍රථම අදියරේ දී ව්‍යවසායකයා විසින් අදහස් ජනනය කර ගැනීමත්, පරිසර අධ්‍යයනය තුළින් අවස්ථා හඳුනා ගැනීමත් වෙළෙඳපොළ අධ්‍යයන කිරීමත් සිදු කරයි.

2. සංකල්ප ගොඩනැගීම සහ ව්‍යාපාර සැලැස්ම සැකසීම
   මෙම අදියරයේ දී ව්‍යාපාර සැලැස්මක් සකස් කෙරේ. එමගින් ව්‍යාපාර අදහස පැහැදිලි කෙරෙන විස්තරාත්මක වැඩපිළිවෙලක් ඉදිරිපත් කෙරේ.

3. අවශ්‍ය සම්පත් සම්පාදනය
   මෙම අදියරේ දී ව්‍යවසායකයා විසින් ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය, මානව සහ භෞතික සම්පත් හඳුනා ගන්නා අතර, ඒවා අත්කර ගැනීමට කටයුතු කරයි.

4. යථාර්ථයක් බවට පත් කිරීම
   මෙම අදියරේ දී ව්‍යවසායකයා ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සිදු කරන අතර, ව්‍යාපාර අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්පත් උපයෝගී කර ගනී.

5. ප්‍රතිලාභ ලැබීම
   ව්‍යාපාරයේ අනාගත වර්ධනය හා සංවර්ධනය පිළිබඳ තීරණ ගැනීම ව්‍යවසායකයා සිදු කරන්නේ මෙම අදියරේ දී ය.

08. කුඩා කල සිට ම ඕනෑම දෙයක් පිළිබඳව වෙනස් ආකාරයෙන් සිතීමට පුරුදුව සිටි සිතුමිණි පාසල් අධ්‍යාපනය නිම කිරීමෙන් අනතුරුව විනෝදාංශයක් ලෙස සුරතල් මසුන් ඇති කිරීමට පුරුදුව සිටියා ය. ටික කලකට පසු සෑම සති අන්තයේ ම නගරයේ වෙළෙඳ පොළට ගොස් මසුන් අලෙවි කිරීමේ ද නිරත වන ලදී. පසුව ඇය විසින් නගරයේ කුලී පදනම මත ලබා ගත් කුඩා කඩකාමරයක සුරතල් මසුන් ඇති කර විකිණීමේ මින්මැදුරක් ආරම්භ කරන ලදී.

(i) සිතුමිණි සතු ව්‍යවසායකත්ව ගතිලක්ෂණ **හතරක්** නම් කරන්න.
- නිර්මාණශීලි බව
- අවස්ථා හඳුනාගැනීම
- කැපවීම
- ආත්ම විශ්වාසය
- උත්සාහය
- අවදානම් භාරගැනීම
- දූරදර්ශී බව

(ii) සිතුමිණි කුමන ව්‍යවසායකත්ව වර්ගයකට අයත් වේ ද? එහිදී ඇයට මුහුණපෑමට සිදුවිය හැකි අභියෝග මොනවාද?

කාන්තා ව්‍යවසායකත්වය

අභියෝග
1. පුරුෂාධිපත්‍යය
2. පෞද්ගලික ජීවිත භූමිකාව හා ව්‍යවසායකත්ව භූමිකාව යන පැතිකඩ දෙක සමබරව පවත්වා ගැනීමේ අභියෝගය
3. කාන්තාවන්ට තම ගෘහ ජීවිතයට මුල්තැන දීමට සිදු වීම
4. සමාජීය වශයෙන් පවතින සෘණ ආකල්ප / කාන්තා ස්වාධීනත්වය සමාජය තුළ තවමත් ස්ථාපිත නොවීම

5. සාම්ප්‍රදායික බවින් මිදීමට අකමැති වීම / සාම්ප්‍රදායෙන් ඔබ්බට ගොස් ව්‍යාපාර කටයුතු කිරීමට ඇති අකමැත්ත
6. කාන්තා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩ සටහන් ප්‍රමාණවත් නොවීම
7. අවදානම් භාර ගැනීමට මැලි වීම
8. ව්‍යවසායකත්ව කුසලතා අවම වීම
9. කාන්තාවක් වීම / කාන්තාවක් වශයෙන් සමාජයේ පිළි ගැනීම
10. ණය ගැනීමේ දී පරිස්සම් වීම

09. අභ්‍යන්තර ව්‍යවසායකත්වය හඳුන්වා එමගින් ව්‍යාපාර ආයතනයකට අත්වන ප්‍රතිලාභ සඳහන් කරන්න.

සංවිධානවල විවිධ තනතුරුවල කටයුතු කරන නිර්මාණශීලී පුද්ගලයින් එම ආයතනවල නිෂ්පාදිත හා නිෂ්පාදන ක්‍රමවල වෙනස්කම් කරමින් ආයතනයක් තුළ ක්‍රියාත්මක වන ව්‍යවසායකත්වය යි.

නැතහොත්,

සංවිධානවල කටයුතු කරන නිර්මාණශීලී පුද්ගලයන් විසින් නිෂ්පාදනයේ නවෝත්පාදන ක්‍රම හඳුන්වා දීම ය.

**ප්‍රතිලාභ**

1. ආයතනය තුළින් නවෝත්පාදනයන් බිහි වීම
2. ආයතනයේ කීර්තිනාමය ඉහළ යාම
3. තරගකාරීත්වයට මුහුණදිය හැකි වීම
4. සේවකයින් අභිප්‍රේරණය වීම හා තෘප්තිමත් සේවකයින් සිටීම
5. ආයතනයේ ඵලදායීතාවය ඉහළ යාම හා ලාභදායීත්වය වර්ධනය වීම
6. ආයතනයේ සේවකයින්ගේ ජීවන තත්වය ඉහළ යාම

10. ලෝකය තුළ සිදුවන සෑම ක්‍රියාවක ම වාසිදායක පැතිකඩ මෙන්ම අභියෝගකාරී තත්වයන් ද දක්නට ඇත. ඒ අනුව ව්‍යවසායකයින්ට මුහුණ දීමට සිදුවන අභියෝග ලෙස හඳුනාගෙන ඇත්තේ මොනවා ද?

1. මනෝවිහිතිය
2. ගතානුගතික බව
3. අනුකරණය
4. පවුල
5. සංස්කෘතිය හා සමාජය
6. පරිසරය / අහිතකර පරිසරය / තර්ජන බහුල වීම
7. ආගමික බාධා

11. "බොහෝ ව්‍යවසායකයින් ඔවුන්ගේ ව්‍යාපාර ලබා ඇත්තේ පරම්පරා උරුමයෙන් ය." මෙම ප්‍රකාශය සත්‍ය ද? අසත්‍ය ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

මෙය විවාදයට තුඩු දුන් කරුණකි. එබැවින් මෙය සත්‍ය බවට ද, අසත්‍ය බවට ද තර්ක ඉදිරිපත් කළ හැකි වේ.

**සත්‍ය බවට ඉදිරිපත් කළ හැකි තර්ක**

ව්‍යාපාරික පසුබිමක් ඇති පවුල්වල අය ව්‍යාපාර පිළිබඳ නැඹුරුව හා කුසලතා උපතින්ම ලබති. නිරන්තරව අසන්නට, දකින්නට ලැබෙන දෙයින් හා පවුලේ අදහස්, උදහස් නිසා විවිධ අත්දැකීම් ගොනු කර ගනිති. මෙලෙස නිරායාසයෙන්ම ව්‍යාපාර කුසලතා ග්‍රහණය කර ගනියි.

**අසත්‍ය බවට ඉදිරිපත් කළ හැකි තර්ක**

කිසිම ව්‍යාපාරික පසුබිමක් නොමැති අය ද ව්‍යාපාරවලට නැඹුරුවී ඇත. පවුල් පරිසරය හැර අධ්‍යාපනය, පුහුණුව හා සංවර්ධනය, බාහිර පරිසරයෙන් ලද අත්දැකීම්, සමාජ ප්‍රශ්න, තම නිසග කුසලතා / ශක්තිය මත ව්‍යාපාර ආරම්භ කර පවත්වා ගෙන යන අය ද ඇත.

12. රටක ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීමේ පුළුල් වගකීමක් එරට රජයට පැවරී ඇත. ඒ අනුව රජයක් ලෙස දායක විය හැකි ආකාර මොනවා ද?

1. මූල්‍ය දිරිගැන්වීම් ලබා දීම (එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය වැඩසටහන)
2. යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
3. තාක්ෂණික පහසුකම් සැපයීම - ශිල්පීය ව්‍යවසාය ඉන්කියුබේටර් (Technology Business Incubator) සංවර්ධනය
4. බදු සහන ලබා දීම
5. වෙළෙඳපොළ පහසුකම් ඇති කිරීම
6. උපදේශනය සැලසීම
7. පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා දිරි දීම
8. ව්‍යවසායකත්ව අධ්‍යාපනය නඟා සිටුවීම
9. කාන්තා ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම
10. ආර්ථිකය ඩිජිටල්කරණය කිරීම
11. ව්‍යවසායකයින් සඳහා ණය ආරක්ෂණ වැඩ පිළිවෙලක් ක්‍රියාවට නැංවීම

සැකසුම: බණ්ඩාර දිසානායක
B.Sc. (Mgt.) Sp.